සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education

88	S	I

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2026 පෙරහුරු පරීක්ෂණය

General Certificate of Education (Ord.Level) Examination, 2026 Preliminary Exam

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I, II

Design & Construction Technology I, II

පැය තුනයි

Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

Additional Reading Time - 10 min

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීම ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I

උපදෙස් :

* **සියලු ම** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් **නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (x) ලකුණ යොදන්න.**

* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ඉලිප්සයකට ඇති නාභි ගණන,

   (1). 1 කි. (2). 2 කි. (3). 3 කි. (4). 4 කි.

2. පියන හා පතුල රහිත සිලින්ඩරයක් දිග හරින විට දක්නට ලැබෙන්නේ,

   (1). සමචතුරස්‍රයකි. (2). රොම්බසයකි.

   (3). වෘත්තයකි. (4). සෘජුකෝණාස්‍රයකි.

3. A. ———— _ ———— _ ————

   B. -

   C. ————————————————

   D. ————————————————

ඉහත රේඛා අතරින් මධ්‍ය රේඛාවක් දැක්වීමට භාවිතා කරනු ලබන්නේ කවරක් ද ?

(1). A. (2). B. (3). C. (4). D.

Past Papers Wiki

4. පැන්සලක 2H ලෙස සඳහන් වේ නම්, එයින් දැක්වෙන්නේ,

(1). පැන්සලෙහි ඇති මකනයේ පිරිවිතරය යි.

(2). භාවිතා කළ යුතු කවකටුවේ පිරිවිතරය යි

(3). පැන්සල් තුඩෙහි පිරිවිතරය යි.

(4). පැන්සලෙහි ලීයේ පිරිවිතරය යි.

5. අසමාන වෘත්ත දෙකකට තීර්යක් ස්පර්ශයක් ඇඳීමේ දී අවශ්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?

A - වෘත්ත 2හි අරයන්

B - වෘත්ත දෙකක කේන්ද්‍රය අතර දුර

C - වෘත්ත දෙකෙහි අරයන්ගේ එකතුව

(1) A පමණි.

(2) B පමණි.

(3) A හා B පමණි.

(4) A ,B හා C සියල්ල

6.



රූපයේ දක්වා ඇත්තේ ඍජු ප්‍රක්ෂේපණ සමාංශක රූපයකි.මෙහි නෙවන කෝණ ඍජු ප්‍රක්ෂේපණ පෙනුම නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1)



(2).



(3).



(4).



7.



රූපයේ ABCD ලෙස දක්වා ඇත්තේ කේතුවක්, එහි අක්ෂය දිගේ ඡේදනය වන ආකාරය යි.මෙහි ABCD රේඛා හරහා ඡේදනය කළ විට ලැබෙන ජ්‍යාමිතික රූප පිළිවෙළින් ඇතුලත් වරණය තෝරන්න.

(1) වෘත්තය,ඉලිප්සය,පරාවලය,බහුවලය

(2) වෘත්තය,ඉලිප්සය, බහුවලය, පරාවලය

(3) බහුවලය ,වෘත්තය,ඉලිප්සය, පරාවලය

(4) බහුවලය , ඉලිප්සය, පරාවලය,වෘත්තය,

8. රූපයේ දැක්වෙන ලුප්ත (ඡේදිත) ෂඩාස්‍රාකාර ප්‍රිස්මයක විකසනය නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.



(1).



(2).





(3).



(4).



9. පුරාතන ශ්‍රී ලංකාවේ වතුර මල් ජල තාක්ෂණය ඉහල මට්ටමක පැවැති බවට ඉදිරිපත් කළ හැකි හොඳම සාක්ෂියක් වනුයේ,පහත සඳහන් කවරක් ද?

(1). සොරබොර වැව

(2). පරාක්‍රම සමුද්‍රය

(3). ලෝවාමහා පාය

(4). සීගිරි පර්වතය

10. ඉදිකිරිම් කර්මාන්තයේ දී කොන්ක්‍රීට් වැරගැන්වීම සඳහා වැරගැන්නුම් කම්බි භාවිත කරයි.වැරගැන්නුම් කම්බියක් **නොවන්නේ** කුමක් ද?

(1). නාරටි වානේ කම්බි (2). මෘදු වානේ

(3). දඟර වානේ (4). 'L' හැඩැති දඬු වානේ

11. උත්සව ශාලාවක බිත්ති මත ඉතා පහසුවෙන් හා ඉක්මනින් නිමහම් කරගැනීමට සුදුසු ක්‍රමය කුමක් ද?

(1). බිම් උළු ඇතිරීම (2). ආස්තරණ යෙදීම

(3). තීන්ත ආලේපනය (4). කෘතිම ගල් ඇල්ලිම.

12. ඉවතලන ලද ලී කොටස් කිහිපයක් කම්බි ඇණ ගසා ඇති බව දැකගත හැකි විය.එම ඇණ ගළවා ඉවත් කිරීමට භාවිත කළ හැකි මිටි වර්ගය සඳහන් නිවැරදි වරණය තෝරන්න,

(1). අඩු මිටිය (2). අතකොළුව

(3). බෝල පෙති මිටිය (4). හරස් පෙති මිටිය

13. ගෘහස්ථ නාන කාමරයක ජල බැස්ම නිසි ආකාරව සිදු වීමට එහි ආනතිය සකස් කරගැනීම සඳහා යොදා ගන්නා උපකරණයකි.

(1) ලෙවල් බටය (2) කුස්තානම

(3) මුලු මට්ටම (4) ස්වාය මට්ටම් ලෑල්ල

14. ඉදිකිරීම් වැඩ බිමක නේවාසිකව සිටින කම්කරුවන් සඳහා ඉදිකිරීමට යෝජිත තාවකාලික වැසිකිලියක, දොර සඳහා දොර ලෑලි මුට්ටු සුදුසු මුට්ටු වර්ගයක් වනුයේ,

(1) පුළුක්කු මුට්ටුව (2) තට්ටු මුට්ටුව

(3) දිවත සහිත පුළුක්කු මුට්ටුව (4) හුලස් හේත්තු මුට්ටුව

15. නිවසක ප්‍රධාන දොර පියනක පසාරු කැටයමක් සකස් කිරීම සඳහා වන කාර්යයන් වලදී බහුල ලෙස උපයෝගි වන නියන් වර්ගය කුමක් ද?

(1) පැති නියන (2) රේගල් නියන

(3) පට්ටම් නියන (4) බොකු නියන

16. වර්තමානය තුළ ඉදිකිරීම් කටයුතු කරන නවීන පන්නයේ නිවාසවල විවිධ රටා හා හැඩ වලින් යුක්ත උළු කැට සෙවිලි කර තිබීම දැකගත හැකිය.මෙසේ එම උළු කැට මත විවිධාකර හැඩ නිර්මාණය කිරීම සිදු කළ හැකි වී තිබෙනුයේ ,උළු නිපදවීමට ගන්නා මැටිවල ඇති කිනම් ගුණාංගය නිසා ද?

(1) භංගුරතාවය(Brittleness) (2) සුවිකාර්යතාවය (Plasticity)

(3) ප්‍රත්‍යස්ථතාවය(Elasticity) (4) විලයනීයතාවය. (Fusibility)

17. බිත්ති කපාරාරු කිරීම සඳහා හුණු භාවිත කරයි. දැවුණු හුණු ලබාගැනීමේ රසායනික ප්‍රතික්‍රියාව සඳහන් වන නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) $CaCO_3 \xrightarrow{\triangle} CaO + CO_2 \uparrow$

(2) $CaO + CO_2 \xrightarrow{\triangle} CaCO_3 \uparrow$

(3) $CaCO_3 \xrightarrow{\triangle} CaO + CO_2 \uparrow$

(4)) $2CaO + Al_2O_3 \xrightarrow{\triangle} Ca_3(AlO_3)_2 \uparrow$

18. බඩගල් බැම්ම රටාවට අනුව බදින ලද පංති කාමර වෙන් කිරීම් බිත්තියක් 1 m^2 ක් බැඳීම සඳහා අවශ්‍ය මැටි ගඩොල් ප්‍රමාණය ගල් 120 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.මෙම වෙන් කිරීම් බිත්තියේ උස හා දිග පිළිවෙලින් 1.5 m , 6m වේ නම්,ගල් බැඳීමට අවශ්‍ය සම්පූර්ණ ගල් ප්‍රමාණය කීය ද?

(1) ගඩොල් 1000 කි. (2) ගඩොල් 1080 කි.

(3) ගඩොල් 1100 කි. (4) ගඩොල් 1050 කි.

19. නිර්මාණ කටයුත්තකට යොදාගන්න අහල් 6 ක් , පළලැති ලෑලි කැබැල්ලක් වරක්කලය ආධාරයෙන් එක හා සමාන කොටස් 3කට බෙදා වෙන්කර ගත යුතුව ඇත.මෙසේ බෙදා වෙන් කිරීමේදී එක් කොටසකට අයත් වන මිලිමීටර්(mm) ප්‍රමාණය කොපමණ ද ?

(1) 42 mm. (2) 50 mm. (3) 58 mm. (4) 62 mm.

20. කාර්යාල කාමරයක ඉඩකඩ උපරිම වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි හා එහි ඇති ගෘහ භාණ්ඩ එහා මෙහා කිරීමකින් තොරව අදාළ කටයුතු කරගෙන යාමට, එහි පහසුවෙන් හා ඉක්මනින් සකස් කිරීම යෝජනා කළ හැකි දොරක් වනුයේ,පහත සඳහන් කවරක් ද?

(1) රූටන දොර(Sliding Door) (2) අසව් දොර(Hingers Door)

(3) හකුලන දොර (Roller Shutter Door) (4) කලම්ප දොර(Clamp Door)

21. සංචාරක කාලසීමාව වෙනුවෙන් මුහුදු වෙරලක් ආශ්‍රිතව කබානා අවන්හලක් තාවකාලිකව ඉදිකිරීම සඳහා හිමිකරුවන් විසින් අදහස් කර ඇත. මෙහි ඉදිකිරීමේ දී කටයුතු කිරීමේදි වඩාත් සැලකිලිමත් විය යුත්තේ,

(1) සජීවී භාරයන් පිළිබඳ ය. (2) අජීවී භාරයන් පිළිබඳ ය.

(3) පාරිසරික භාරයන් පිළිබඳව ය. (4) වෙනත් භාරයන් පිළිබඳ ය.

22. කාර්මික ආවුද හා උපකරණ ගබඩා කර තබා ගැනීම සඳහා ලී යොදාගෙන සෑදීමට අපේක්ෂිත ආවුද පෙට්ටියක් අඟුලු දැමීම සඳහා භාවිත කිරීමට සුදුසු පහසු අඟුල් ක්‍රමයක් වනුයේ පහත සඳහන් කවරක් ද?

(1) බෝල යතුරු තහඩුව භාවිතය
(2) කප්පිලි යතුරු තහඩුව භාවිතය
(3) කොන්ඩිපට්ටම් භාවිතය
(4) අල්ලු භාවිතය

23. අධික සුළං සහිත දිනයක, නිවසක විවෘත කරන ලද වීදුරු ජනේලයක් උළුවහු බදෙහි ඉතා තදින් වැදී වීදුරු කැබලි කිහිපයක් කැඩී බිම වැටිණි, මෙයට ආසන්නතම හේතුවක් විය හැක්කේ,

(1) ජනෙල් අගුල යොදා නොතිබීමයි.
(2) සුළං කොක්ක යොදා නොතිබීමයි.
(3) ජනෙල් කොක්ක යොදා නොතිබීමයි.
(4) ජනෙල් මුදුව යොදා නොතිබීමයි.

24. සිසු නේවාසිකාගාර පද්ධතියක සනීපාරක්ෂක පහසුකම් පවත්වාගෙන යාම වෙනුවෙන් කරාම හා වතුර මල් පද්ධතියක් ඉදිකිරීම යෝජනා වී ඇත.මෙහි ප්‍රධාන ජල පහරට කරාම කිහිපයක් සවි කිරීම සඳහා පහසුවෙන් හා පිරිවැය අවම කරගනිමින් කරාම සවි කිරීම සඳහා භාවිත කළ හැකි උපාංගයක් වනුයේ කවරක් ද?

(1) සමාන T කෙවනිය
(2) කරාම කෙවනිය
(3) කරාම T කෙවනිය
(4) කරාම කපාට කෙවනිය

25. ලිදකින් ජලය ලබා ගැනීමේ දී ජල ප්‍රභවය හා මෝටරය අතර තිබෙන චූෂණ මාර්ගය (Suction line) තුළ ජලය හිර කර තබා ගැනීමට භාවිතා කරන කපාටය වනුයේ,

(1) පාද කපාටය යි.
(2) දොරටු කපාටය යි.
(3) බෝල කපාටය යි.
(4) නැවතුම් කපාටය යි.

26. දීර්ඝ කාලීනව භාවිතා නොකර තිබූ පාසි හා දියසෙවල බැදුණු ගඩොල් බිත්තියක් කපරාරු කිරීමට ප්‍රථම පිරිසිදු කර ගැනීම සඳහා භාවිතා කළ හැකි සුදුසුම උපකරණය කුමක් ද?

(1) මෙසන් හැන්ද
(2) කම්බි බුරුසුව
(3) වැලි කඩදාසිය
(4) කටු හැන්ද

27. පසාරු කුඩුම්බි මුට්ටුව නිර්මාණයේ දී , එම නිර්මාණයට යොදා ගන්නා දැව කොටස සමාන පරිමාණ තුනකට බෙදා වෙන් කර ගැනීමට භාවිතා වන උපකරණයක් වනුයේ,

(1) වරක්කලයයි.(Marking Guage)
(2) කුඩිම්බි වරක්කලයයි. (Mortice Guage)
(3) අදින පිහියයි.
(4) රාමු කියතයි. (Mitre Saw)

28. ජනෙල් පියනක් දැවයෙන් නිර්මාණය සඳහා රේගල් විද විදුරු සවි කරගැනීම සඳහා වන කාර්යයන් වලදී, එම වැඩ කොටස් හිර කර තබා ගැනීමට භාවිත කරන උපකරණයක් වනුයේ,

(1) G කරාමයයි. (2) T කරාමයයි.

(3) හිටි කරාමයයි. (4) ටැබ කරාමයයි.

29. දැව උළුවහු නිර්මාණ කර්යයන් වලදී කුඩුම්බි තව් සකස් කර ගැනීම සඳහා භාවිත කරන උපකරණ කට්ටලය නිවැරදිව සඳහන් වරණය කුමක්ද?

(1) රේගල් නියන , අතකොලුව (2) රේගල් නියන , අඩුමිටිය

(3) පට්ටම් නියන,බෝල පෙති මිටිය (4) රේගල් නියන, රබර් මිටිය

30. කත්තු මල්ලී මුට්ටුවෙහි විවිධ කෝණ ඇඳ ගැනිම සඳහා භාවිතා වන උපකරණය වනුයේ,

(1) වරක්කලයයි.(Marking Guage) (2) මුලු මට්ටමයි. (Try Square)

(3) අදින පිහියයි. (Marking Kife) (4) ස්වාය මට්ටම් ලෑල්ලයි. (Bevel Square)

31. සිව් මහල් ගොඩනැගිල්ලක තුන්වන තට්ටුවේ තුනී ජේද (Slab) දැමීමට,කොන්ක්‍රීට් මිශ්‍රණය සඳහා කම්පක භාවිත කරමින් කොන්ක්‍රීට් බැහුම් පරීක්ෂාව සිදු කරයි. ඉහත පරීක්ෂණය සිදු කිරීමට හේතුව කුමක් ද?

(1) කොන්ක්‍රීට් සඳහා යොදාගනු ලබන ජල ප්‍රමාණය මැනිම සඳහා,

(2) කොන්ක්‍රීට් වල ශක්තිමත් බව මැන බැලීමට සඳහා

(3) කොන්ක්‍රීට් මිශ්‍රණයේ වැඩ කිරීමේ හැකියාව මැනීම සඳහා,

(4) කොන්ක්‍රීට්වල ද්‍රව්‍ය ප්‍රමාණ නියමිත පරිදි මැන බැලීම සඳහා,

32. පාරම්පරික ලී වැඩ කර්මාන්තයේ බහුල ව විදීමේ කර්යය සඳහා භාවිතා කළ ආවුද උපකරණ කට්ටලය පිළිබඳව විස්තර පහත දක්වා ඇත.

A - නියන , රෑවට් බුරුමය

B - අත් විදුම් යන්ත්‍රය , බුරුම කටුව

C - රෑවට් බුරුමය , අවගාරය

D - බුරුම කටුව , නියන

මෙම A , B , C , D අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා D පමණි (3) B හා C පමණි. (4) C හා D පමණි.

33. ගොඩනැගිල්ලක් ඉදිකිරීමට පෙර මට්ටම ගැනිමට ලෙවලය භාවිත කිරීමට හැකි වුව ද,අඩු කාලයකින් වැඩි ප්‍රදේශයක තිරස් තලයක් මට්ටම් ගැනීමට සුදුසු උපකරණය වන්නේ කුමක් ද?

(1) ලෙවලය (Sprit level) (2) තියඩොලයිට්ටුව(Theodolite)

(3) ලේසර් ලෙවලය(Leser level) (4) ලෙවල් බටය(Level Tube)

34. ගොඩනැගිලි ඉදිකිරීමේ දී කොන්ක්‍රීට් මිශ්‍ර කිරීම සඳහා අවශ්‍ය සමාහාර මැනීමට ආමාන පෙට්ටිය භාවිත වන අතර සිමෙන්ති මැනීමට භාවිත කරන ආමාන පෙට්ටියේ දිග, පළල,උස පිළිවෙලින් සඳහන් වන වරණය කුමක් ද?

(1) 400mm x 350mm x 290mm

(2) 400mm x 350mm x 250mm

(3) 400mm x 250mm x 290mm

(4) 400mm x 350mm x 300mm

35. නිවාස වැඩබිම් සංකීර්ණයක් තුළ එහි ආරක්ෂක රාජකාරි කටයුතු වෙනුවෙන් නිළධාරි මහතෙකු සේවයෙහි යෙදවීමට එහි පාලන අධිකාරිය තීරණය කර තිබුණි. නිවාස සංකීර්ණයෙහි අවසන් ඇස්මේන්තු සැකසීමේදී එම, ආරක්ෂක වියදම් යොදා ගැනෙනුයේ,

(1) ශ්‍රම වියදම් වලටය.

(2) උඩිස් වියදම් වලටය.

(3) සාමාන්‍ය වියදම් වලටය.

(4) ප්‍රාග්ධන වියදම් වලටය.

36. ලී වැඩ කර්මාන්තයේ දි ලී කැපීම සඳහා කියත භාවිත වන අතර,කියත මුවහත් කිරිමට පීර අවශ්‍ය වේ. මුවහත් කිරීමෙන් පසු පිරි ගබඩා කිරිමට පෙර, මල කෑම වැළැක්වීම සඳහා ගතයුතු උපක්‍රමය කුමක් ද?

(1) පීරේ කැරළි මත ග්‍රීස් ආලේප කිරිම.

(2) පීරේ කැරළි මත අඟුරු හෝ හුණු ආලේප කිරිම.

(3) පීරේ කැරළි මත තෙල් ආලේප කිරිම.

(4) පීරේ කැරළි මත තීන්ත ආලේප කිරිම.

37. බහු කාර්මික ලී වැඩ යන්ත්‍රයක් උපයෝගී කර ගනිමින්, ලී කොටසක් යතු ගාමින් සිටි කාර්මිකයෙකු ඇදී ගොස් අත්කට සුළු තුවාල සිදු විමක් ඇතිවිය.මෙම අවස්ථාව සිදු වීමට බල පෑ හැකි ආසන්නතම හේතුවක් විය හැක්කේ , කාර්මිකයා,

(1) එල්ලා වැටෙන ඇදුම් භාවිතා කිරීමයි.

(2) යන්ත්‍රය නිසි පරිදි නඩත්තු නොකිරීමයි.

(3) හිස් ආවරණ භාවිත නොකිරීමයි.

(4) වැඩ ස්ථානයේ ඉඩකඩ නොමැති වීමයි.

PAST PAPERS WIKI

38. වැඩ පොළක ලිහිසි තෙල් වහනය වන ස්ථානයක් පැලදීමට සුදුසු උපාංග පිළිබඳව , එම ස්ථානයේ පිවිසුම් දොරටුව අසල රැඳවීමට වඩාත් සුදුසු සංඥා පුවරුව, දැක්වෙන පිළිතුරු වන්නේ කුමක් ද?

(1) 

(2) 

(3) 

(4) 

39. පුද්ගලයෙකු විසින් රොටරි හැමරය භාවිත කරමින් කොන්ක්‍රීට් තලාදයක් විදීමට පෙර අනුගමනය කළ යුතු වඩාත් ආරක්ෂිත ක්‍රමවේදය වනුයේ,

(1) යන්ත්‍ර නිෂ්පාදකයින් විසින් නිකුත් කර ඇති උපදෙස් අනුගමනය කිරීම යි .

(2) මත්පැන් භාවිත කිරීම නිසා ඇතිවන සංකූලතාවය නොසලකා වැඩ කිරීම යි.

(3) ආරක්ෂිත ඇදුම් පැලදුම් හා අනෙකුත් ආරක්ෂිත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම යි.

(4) සැපසුම් විදුලි රැහැනේ පලදු වීම් තිබුණද , නොසලකා හැර වැඩ කිරීම යි.

40. නිවාස බිත්තියක් මත තීන්ත ආලේප කිරීමේ දී ඉතාමත් අධික ලෙස තීන්ත වැය වීම දැකගත හැකි විය.මෙයට හේතු විය හැකි ආසන්නතම හේතු ඇතුළත් වරණය තෝරන්න.

(1) හුණු පිරියම් කරන ලද බිත්ති මත පින්සල මඟින් තීන්ත ආලේපය.

(2) හුණු පිරියම් කරන ලද බිත්ති මත විසිරන යන්ත්‍ර මඟින් තීන්ත ආලේපය.

(3) කපරාරුව පමණක් කරන ලද බිත්ති මත පින්සලක් මඟින් තීන්ත ආලේපය.

(4) කපරාරුව පමණක් කරන ලද බිත්ති මත විසිරන යන්ත්‍ර මඟින් තීන්ත ආලේපය.

***

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education

88	S	II

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, (2026) පෙරහුරු පරීක්ෂණය

General Certificate of Education (Ord. Level) Examination,(2026) Preliminary Exam

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය I, II

Design & Construction Technology I, II

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II

උපදෙස්:

* පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

1)

(i). වස්තුවක සමාංශක ප්‍රක්ෂේපණ පෙනුමක් පහත දැක්වේ.



ඉහත සමාංශක රූපය අනුව ,

A ඊතලය දෙසින් බලා ඉදිරි පෙනුම ද ,

B ඊතලය දෙසින් බලා පැති පෙනුම ද ,

C ඊතලය දෙසින් බලා සැලැස්ම ද ,

දී ඇති මිනුම් අනුගමනය කරමින් තෙවන කෝණ සෘජු ප්‍රක්ෂේපණ ක්‍රමයට අඳින්න. භාවිත කළ යුතු පරිමාණය 1:1 වේ

(ලකුණු 15)

(ii).පාදයක දිග **40mm** හා උස **70mm** සමපාද ත්‍රිකෝණ ප්‍රිස්මයක විකසනය අඳින්න. (නිර්මාණ රේඛා පැහැදිලිව තිබීම අත්‍යාවශ්‍ය වේ.)

(ලකුණු 05)

02. ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශවල ඉදිකෙරෙන මහල් නිවාස සංකීර්ණ, සාප්පු සංකීර්ණ,සංචාරක හෝටල් වැනි බහුමහල් ගොඩනැගිලි ඉදිකිරීමේ දී ඒවා ශක්තිමත්ව, නිර්මාණාත්මකව සහ ආකර්ශණීය ලෙස ඉදිකිරීම් සඳහා වැරගැන්නුම් කොන්ක්‍රීට් භාවිත කරයි.

(i). කොන්ක්‍රීටයක අඩංගු බැඳුම්කාරකය හා ගොඩනැඟුම්කාරක මොනවාදැයි වෙන් වෙන් වශයෙන් ලියා දක්වන්න. **(ලකුණු 2)**

(ii). ඉදිකිරීම් කාර්යයේ දී කොන්ක්‍රීට් වැරගැන්වුම් සඳහා භාවිත වන වැරගැන්වුම් කම්බි වර්ග තුනක දළ රූප සටහන් ඇඳ, ඒවා නම් කරන්න. **(ලකුණු 3)**

(iii). ඉදිකිරීම් කටයුතු වල උසස් ප්‍රමිතිය හා ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා ගුණාත්මකභාවයෙන් යුතු වානේ කම්බි තෝරාගත යුතුය. එම තෝරාගැනීමේ දී සලකා බැලිය යුතු වැදගත් කරුණු පහක් ලියා දක්වන්න. **(ලකුණු 5)**

03. නිසි පරිදි නඩත්තු නොකළ ආවුද හා උපකරණ වලින් ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ කිරීමේ දී බොහෝ අනතුරුවලට මුහුණපෑමට සිදු වේ.

(i). කැපීමේ කාර්යයට යොදාගන්නා ආවුද මුවහත් තැබීම සඳහා භාවිත කරන උපකරණ දෙකක් නම් කරන්න. **(ලකුණු 2)**

(ii). මොට වූ අත් කියතක් මුවහත් තැබීමේ දී අනුගමනය කරන පියවර හතරක් නම් කර, ඒවා රූප සටහන් ඇසුරෙන් විස්තර කරන්න. **(ලකුණු 4)**

(iii).

a. ආවුද හා උපකරණ වලින් ලී වැඩ කිරීමේ දී සිදු විය හැකි අනතුරු මොනවදැයි ලියා දක්වන්න,

b. ඉහත ඔබ සඳහන් කළ අනතුරු ඇති විය හැකි ආවුද හා උපකරණ ලියා, ඒවා වළක්වාගත හැකි ක්‍රමවේදය කෙටියෙන් පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

04. වර්තමානයේ සිදුවන කාලගුණික විපර්යාස තත්ත්වයන් සමග කඳුකර ප්‍රදේශවල පාංශු ඛාදනය වීම් ශ්‍රී ලංකාව තුළ බහුලව දැකගත හැකිය.

(i). භූමියේ ඉහල බෑවුම් ප්‍රදේශවල සිදුවන පස් සෝදායාම් පාලනය කිරීම සඳහා කඩාගත් කලුගල් කැබලි යොදා ගනිමින් ඉදිකරන බැම් වර්ගය කුමක් ද? **(ලකුණු 2)**

(ii). ඔබ ඉහත සඳහන් කළ බැම් වර්ගය භාවිතා කරන වෙනත් අවස්ථා හතරක් ලියා දක්වන්න. **(ලකුණු 4)**

(iii). කලුගල් යොදා ගනිමින් සකස් කරන මෙම බැම් වර්ගය නිර්මාණය කරන ආකාරය කෙටියෙන් හඳුන්වා, එම බිත්ති ගොඩ නැංවීමේදී බදාම නොයෙදීමට හේතුව කුමක් දැයි පැහැදිලි කරන්න. **(ලකුණු 4)**

05. වර්තමාන ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතුවල දී සවි ශක්තියෙන් යුතු හැටුම් භාවිතා කිරීම බහුලව දැකගත හැකිය.

(i) වර්තමාන ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ හැටුම් නිර්මාණය කිරීම සඳහා යොදාගන්නා අමුද්‍රව්‍ය දෙකක් ලියා දක්වන්න. **(ලකුණු 2)**

(ii) ශිෂ්‍ය නේවාසිකාගාරයක් සඳහා බාහිරින් කොන්ක්‍රීට් ජල කුලුනක් ඉදිකිරීමට යෝජනා වී ඇත.මෙම ජල කුලුන නිර්මාණය කිරීමට ප්‍රථම නිර්මාණ ශිල්පියා විසින් සලකා බැලිය යුතු හැටුමේ මූලික ගුණාංග දෙකක් සඳහන් කර කෙටියෙන් විස්තර කරන්න. **(ලකුණු 2)**

(iii) මෙම ශිෂ්‍ය නේවාසිකාගාරය සඳහා ඉදිකරන ලද ජල කුලුනෙහි ක්‍රියාත්මක විය හැකි ප්‍රධාන භාර තුනක් නම් කර, උදාහරණ සහිතව රූප සටහන් මගින් පැහැදිලි කරන්න. **(ලකුණු 6)**

06. නිවසක භාවිතයට ගන්නා සනීපාරක්ෂක භාණ්ඩ සඳහා ක්‍රමවත් ජල සැපයුමක මෙන්ම විධිමත් අපත ජලය බැහැර කිරීමක් ද තිබිය යුතුය.

(i) පුද්ගල භාවිතයට ගන්නා සනීපාරක්ෂක භාණ්ඩ දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 2)**

(ii) ගොඩනැගිල්ලකට ජල සම්පාදන පද්ධතියක් ඉදිකිරීමට ප්‍රථම සලකා බැලිය යුතු කරුණු තුනක් කෙටියෙන් දක්වන්න. **(ලකුණු 3)**

(iii) නිවසක ජලනළ පද්ධතියක් එළිමේදී ජලනළ සම්බන්ධ කරන ආකාරය පියවර වශයෙන් සඳහන් කර, එම ජල නළ පද්ධතිය ස්ථාන ගත කළ හැකි ක්‍රම දෙකක් සඳහන් කරන්න. **(ලකුණු 5)**

07. දෙපල වහලය සහිත ගරාජ්යක කණු අතර දිග හා පළල 6m x 6m වේ.එම වහලයට වැසි ජලය බැසයාමට පිළිසවිකිරිම සඳහා වඩිම්බු ලෑලි ගැසීමට යෝජනා කර ඇත.



අවශ්‍ය ද්‍රව්‍ය :-

- වහලයේ අඟුව 1m කි
- වඩිම්බු ලෑල්ලක පළල 250mm වේ.
- පුහුණු ශ්‍රමය දින 02ක් අවශ්‍ය වේ.
- නුපුහුණු ශ්‍රමය දින 02ක් අවශ්‍ය වේ.
- සම්පූර්ණ කාර්යය සඳහා තීන්ත ලීටර් 4 ක් වැය වේ.තීන්ත ලීටරයක් රු.950.00

(i) වඩිම්බු ලෑලි ගැසීම සඳහා අවශ්‍ය වන සම්පූර්ණ ලෑලි ප්‍රමාණය කොපමණ වේ ද?
(සම්මත ඒකක සමග දක්වන්න) **(ලකුණු 2)**

(ii) ලෑලි දිග 1 m ක් සඳහා මුදල රු. 1250.00 ක් නම් ලෑලි සඳහා යන සම්පූර්ණ වියදම කීය ද?
(ලකුණු 1)

(iii) දිනක පුහුණු ශ්‍රමය සඳහා කුළිය රු.3000ක් ද,නුපුහුණු ශ්‍රමය සඳහා දිනක කුලිය රු.1500ක් ද, නම් කර්යය සඳහා යන ශ්‍රම වියදම කීය ද? **(ලකුණු 2)**

(iv) වඩිම්බු ගසා තීන්ත ආලේප කර සම්පූර්ණ කාර්යය නිම කිරීම සඳහා යන සම්පූර්ණ වියදම කොපමණ දැයි ගණනය කර දක්වන්න. **(ලකුණු 5)**

***

OL/2026/88/S-I.II

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education

88 S I

கல்வி அமைச்சு

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2026 පෙරහුරු පරීක්ෂණය

General Certificate of Education (Ord. Level) Examination 2026 Preliminary Exam

නිර්මාණකරණය හා ඉදිකිරීම තාක්ෂණවේදය I

I පත්‍රය - පිළිතුරු

ප්‍රශ්න අංකය	පිළිතුරු	ප්‍රශ්න අංකය	පිළිතුරු
01.	2	21.	3
02.	4	22.	3
03.	1	23.	2
04.	3	24.	3
05.	4	25.	1
06.	2	26.	2
07.	1	27.	2
08.	1	28.	2
09.	4	29.	1
10.	4	30.	4
11.	2	31.	3
12.	1	32.	3
13.	1	33.	2
14.	4	34.	1
15.	4	35.	2
16.	2	36.	2
17.	1	37.	1
18.	2	38.	4
19.	2	39.	3
20.	1	40.	3

OL/2026/88/S-I.II

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved]

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
Ministry of Education, Higher Education and Vocational Education

88	S	I

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2026 පෙරහුරු පරීක්ෂණය

General Certificate of Education (Ord.Level) Examination 2026 Preliminary Exam

නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය II

Design & Construction Technology II

පැය තුනයි

Three hours

පිළිතුරු පත්‍රය

(01)



පැති පෙනුම

ඉදිරි පෙනුම

<u>පැති පෙනුම</u> (මුළු ලකුණු 04)

සැගි රේඛා දෙකට - 01
ඉදිරි රේඛාවට -01
සම්පූර්ණ වටේ රේඛාව -01
අභ්‍යන්තර U රේඛාව -01

<u>ඉදිරි පෙනුම</u> (මුළු ලකුණු 04)

සැගි රේඛා දෙකට -01
ඉදිරි රේඛාවට -01
සම්පූර්ණ වටේ රේඛාව -01
මැද U රේඛාව 01

<u>සැලැස්ම</u>(මුළු ලකුණු 02)

සම්පූර්ණ වටේ රේඛාව -01
මධ්‍ය සමචතුරස්‍රයට - 01
ප්‍රථම කෝණ ක්‍රමයට <u>01</u> -



1 සැලැස්ම

මුලු ලකුණු 15

නිවැරදි මානයක් යෙදීම -01
රූප සටහන් නම් කිරීම -01

ii.



ත්‍රිකෝණ දෙක සඳහා	-	2
කඩ රේඛා දෙක සඳහා	-	2
පිටත රාමුව සම්පූර්ණ කිරීම	-	1
මුලු ලකුණු	-	5

ඉහත නිර්මාණය සඳහා සුදුසු වෙනත් නිවැරදි නිර්මාණයක් සඳහා ද ලකුණු ප්‍රදානය කරන්න.

02)

i. බැදුම්කාරකය : සිමෙන්ති
ගොඩනැඟුම්කාරක : ගල්,වැලි

(ලකුණු 02)

ii.


මෘදු වානේ

6mm


දහර වානේ

10m,12mm


නාරටි දහර වානේ

10mm,12mm,25mm,

(ලකුණු 03)

iii.

- මළ බැඳී තිබීම පිළිබඳව
- කොටස් පුපුරා තිබීම පිළිබඳව
- තෙල්,ග්‍රීස් ආදිය තැවරීම පිළිබඳව

- හැඩය විකෘති වීම පිළිබඳව
- හරස්කඩ වර්ගඵල වෙනස් වීම පිළිබඳව
- නිෂ්පාදන දෝෂ පිළිබඳව(කම්බියේහි ඇති රටා)

(ලකුණු 05)

(03)

i.

- පිරි වර්ග,වැලිගල්,නිමැදුම් යන්ත්‍ර,තෙත්තියම් අඩුව,කාබරන්ඩම් ගල්,

(මින් කරුණු 02 ලියා ඇත්නම් ලකුණු 02)

ii.

- කියතේ දත් උස් මිටි ගැම



- හැඩය වෙනස් වූ දත් යථා පරිදි හැඩ ගා නැවත වෙනස් කිරීම



- තෙත්තියම් තැබීම්



- මුවහත් තැබීම.

(කරුණු 4 සඳහා ගැලපෙන රූපසටහන් තිබේනම් ලකුණු ලබා දෙන්න)



iii.

a. අත් කැපීම,අත් තැලීම,විදුලි සැර වැදීම,ඇස්ට හානි වීම ආදිය
b. අත් කියත - නියමිත ක්‍රමවේදයට ඇල්ලීම
කැපුම් යන්ත්‍ර - බාහිර ආවරණ ඉවත් නොකිරීම
ඇන්ගල් ග්‍රයින්ඩරය - ඇස් ආවරණ භාවිතය
නියන් - නියමිත ක්‍රමයට භාවිත කිරීම ,

යන ආදිය ලෙස ගැළපෙන් පිළිතුරු ලියා ඇත නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 04)

(04)

i. ගේබියන් රුඳවුම් බිත්ති(Gabion Retaining Wall)

(ලකුණු 02)

ii. ගංගා ආශ්‍රිතව,මුහුදු ආශ්‍රිතව,මායිම් තාප්ප,ගොඩනැගිලි කර්යයන්

(ලකුණු 04)

iii. ගැල්වනයිස් කළ යකඩ කම්බි හෝ පී.වි.සී ආවරණයක් තුළ හෝ ලෝහ කම්බි එකිනෙක වටා අඹරමින් වියා ගන්නා ලද කම්බි දැලක් තුළට කලුගල් කැබලි හිඩැස් වලින් තොරව ඇසිරීමෙන් මෙම බිත්ති නිර්මාණය කර ගනියි.

මෙම ගේබියන් බැඳුම් හරහා (අසුරා සකස් කරන ලද කලුගල්) පහසුවෙන් ජලය බැස යා හැකි ලෙස සකස් කළ යුතු නිසා බදාම නොයෙදීම සිදු කරයි.මේ මගින් බැමීම මත යෙදෙන ජල පීඩනය සිදු කරයි.

(ලකුණු 04

(05)

i. කොන්ක්‍රීට්,ලෝහ වර්ග,දැව වර්ග

(ලකුණු 02)

ii.

- ශක්තිය - ටැංකියේ ජල ධාරිතාවය උපරිම මට්ටමට ලඟා වූ විට නොසැලී පැවැත්ම,ඔරොත්තු දීමේ හැකියාව
- ස්ථායිතාවය-ධාරිතාව උපරිම වන විට හැඩය වෙනස් නොවීම.
- කල්පැවැත්ම - දිර්ඝ කාලීන භාවිතය
- හැඩය - අලංකාර නිමාව.
- අරක්ෂා සහිත බව - හැටුම නිසා අවට සිටින අයට ,ප්‍රයෝජනයට ගන්නා අයට ඉන් හානියක් නොවීම.
- උසස් ප්‍රමිතිය.

(මින් කරුණු 02 සඳහන් කර ඇත්නම් ලකුණු 02)

iii. අජීවී භාරයන් - කොන්ක්‍රීට්/දැව/යකඩ

සජීවී භාරයන් - ගබඩා වී ඇති ජලය

පාරසරික භාරයන් - කාලගුණික තත්ත්වයන්ගේ වෙනස් වීම.(සුළං ,වැස්ස)

(ලකුණු 03 කි.)

Past Papers Wiki



(ලකුණු 03 කි.)

(මුලු ලකුණු 06 කි.)

(6)

i. සෝදන බේසම්
වැසිකිලි බදුන්
නාන වතුර මල **(ගැලපෙන නිවැරදි කරුණු සඳහන් කර ඇත් නම් 1 ලකුණු ලබා දෙන්න)**

ii.

- ජලය ලබා ගැනිමට අපේක්ෂිත ක්‍රමය
- ජල නල පද්ධතිය එලිය යුතු වපසරිය
- ජල නළ පද්ධතියට කපාට යොදාන ,කරාම යොදාන,ජල නළ උපාංග යොදන ස්ථාන පිළිබඳව හඳුනාගැනිම.
- එක් එක් ස්ථනවල යෙදි යුතු නළවල විෂ්කම්භය,පිඩනය පිළිබඳව අවධානය
- බෙදා හරින ජල ධාරිතාවට සරිලන බෙදාහැරීම් තලය

(ගැලපෙන කරුණු 03ක් සඳහන් කර ඇත්නම් ලකුණු 03)

iii.

- කපා ගැනීම
- දාර පිරිසිදු කර ගැනිම
- ද්‍රාවක සිමෙන්ති ආලේපය
- සවි කිරිම
- වියලිම
- ස්ථානගත කිරිම.

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

ස්ථානගත කළ හැකි ක්‍රම.

- පොළොවේ කානු හාරා ඒ තුළ තැම්පත් කිරීම.
- ක්ලිප මගින් ආධාරකයට සවි කිරීම.
- කොන්ක්‍රීට් /ගඩොල් බැම් අතර පිහිටු වීම.
- ආධාරක කම්බි මගින් එල්ලීම.

(පියවර අනුපිළිවෙල සමගින් සඳහන් කර ඇත්නම් ලකුණු 05)

(7)

i. දෙපැත්තක් සඳහා අවශ්‍ය ලෑලි = 2(6 m + 2 m)

= 16 m **(ලකුණු 02)**

ii. ලෑලි සඳහා යන සම්පූර්ණ මුදල = රු.1250 x 16

= රු. 20 000.00

(ලකුණු 01)

ii. පුහුණු ශ්‍රමය දින 2ක් සඳහා = රු.3000 x 2

= රු. 6000.00

නුපුහුණු ශ්‍රමය දින 2ක් සඳහා = රු.1500 x 2

= රු. 3000.00

සම්පූර්ණ කර්යය සඳහ ශ්‍රම වියදම් = රු.6000 + රු. 3000

= රු. 9000.00 (ලකුණු 02)

iv. තීන්ත සඳහා වියදම් = රු.950 x 4

= රු. 3800.00

සම්පූර්ණ වියදම = රු.20 000.00 + රු.9000.00 + රු.3 800.00

= රු. 32,800.00

(ලකුණු 05)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank